**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2016**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂපත්‍රයේ හා ආදායම් වියදම් ගිණුමේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති (ක්ෂය ප්‍රතිපත්තිය හැර) අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 5,356,315 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදල් දායකය රු.330,705 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ රු.406,411 ක් ලෙස දක්වා තිබීමෙන් රු.75,706 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් වටිනාකම රු.101,208 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සේවක භාරකාර අරමුදල් දායකය රු.49,606 ක් වුවද රු.112,108 ක් වියදම් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් රු.62,502 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් වටිනාකම රු.6,802 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) දුරකථන කුලුණු ආදායම මුදල් පදනම යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් කුලුණු 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු.525,833 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයට අනුව ක්ෂය වීම් රු.18,284,101 ක් වත්කම්වලට ගලපා තිබුණද ආදායම් වියදම් ගිණුමට එය වියදමක් ලෙස දක්වා නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.347,682,015 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ලෙජර් ගිණුම්, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබූ බැවින් විගණනයේදී නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ආ) ජංගම නොවන වගකීම් රු. 348,638,234 ක් සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් හා උපලේඛන පවත්වා නොතිබීමෙන් එහි නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු කරගත නොහැකි විය.

(ඇ) එකතු වටිනාකම රු.5,129,165 ක් වූ ප්‍රවේශපත්‍ර ආදායම සම්බන්ධයෙන් රිසිට්පත් හා ආදායම් ලේඛන ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත පරිදි විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. | මුදල් රෙගුලාසි 237 (ආ) | රු.270,720 ක් වටිනා ප්‍රවේශපත්‍ර පොත් වෙනුවෙන් වවුචර්වල තොග සහතික ඇතුළත් කර නොතිබූ අතර, තොග ලේඛනයේ ද සටහන් කර නොතිබුණි. |
| ii. | මුදල් රෙගුලාසි 395 (ඇ) | එක් එක් මාසය අවසානයේ බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| iii. | මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමුච්චිත අරමුදලේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.218,799 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.617,658 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.398,859 ක පිරිහීමක් දක්නට ලැබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ ii කොටසේ 8 වගන්තිය අනුව භාර අරමුදලේ සේවය කරන සියලුම සේවකයින් සඳහා දායක මුදල් ගෙවීමට ආයතනය බැඳී සිටියද, සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් තිදෙනෙකුගෙන් දායක මුදල් අයකර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සියලු පහසුකම් සහිත සංචාරක නිවාස 02 ක් අරමුදල සතු වූ අතර, සමාලෝචිත වර්ෂයේ එම සංචාරක නිවාසවලට යන මාර්ගය අළුත්වැඩියාව සඳහා රු.608,000 ක වියදමක් දරා තිබුණද සංචාරක ආකර්ෂණය වැඩිවන ආකාරයෙන් පුළුල් ප්‍රචාරණයක් ලබා නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එම සංචාරක නිවාසවලින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) හිමිකමක් නොමැති වාහන දෙකක් අළුත්වැඩියා කිරීම හා නඩත්තුව සඳහා අරමුදල මගින් අවස්ථා 07 කදී එකතුව රු.180,358 ක වියදමක් දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා රු.5,313,884 ක් ගෙවා තිබුණ ද කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම, ගිවිසුම්ගතවීම, ඇස්තමේන්තු වටිනාකම හා එකඟ වූ වටිනාකම අතර, අසාමාන්‍ය මිළ විචලනයක් පැවතීම හා ගෙවීම්වලට අදාළ භාරකාර මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

ඉකුත් වර්ෂවල සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.290,444 ක් ද සේවා නියුක්ති භාර අරමුදලට ගෙවීම් ප්‍රමාද වීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.17,206 ක අධිභාරයක් ද ගෙවා තිබුණි.

**4.4 කාර්යසාධනය**

අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වගන්තියේ (අ) සිට (ත) දක්වා වූ අරමුණු 20 න් අරමුණු 5 ක් හැරුණු විට අනෙකුත් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳුන විගණන ඡේද**

මහා භාරකාරවරයා විසින් පවත්වාගෙන යනු ලබන ලෙජරය අනුව අම්බුළුවාව භාර අරමුදල වෙනුවෙන් ඉකුත් වර්ෂවල මුලධන වියදම් සඳහා රු.2,600,000 ක මුදලක් දරා තිබුණ ද එම වියදම් හඳුනාගෙන අරමුදල විසින් ගැලපීම් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග පාලනය
(ඈ) වත්කම් පරිපාලනය